# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# ANNUAL REPORT
# 2012

**ඉඩම් මැනුම් සභාව**
**நில அளவைச்சபை**
**Land Survey Council**

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය
**காணி, காணி அபிவிருத்தி அமைச்சு**
**Ministry of Land and Land Development**

<u>පටුන</u>


| | | | |
|---|---|---|---|
| 1. | සභාපතිගේ පණිවුඩය | | 03 |
| 2. | දැක්ම සහ මෙහෙවර ප්‍රකාශය | | 04 |
| 3. | ඉඩම් මැනුම් සභාවේ කාර්ය භාරයන් | | 05 |
| 4. | ඉඩම් මැනුම් සභාවේ බලතල | | 06 |
| 5. | ඉඩම් මැනුම් සභාවේ කාර්ය සාධනය පිළිබඳ වාර්තාව | | 07 |
| 6. | ඉඩම් මැනුම් සභාවේ කාර්ය මණ්ඩලය | | 07 |
| 7. | කාර්යයන් | | 08 |
| 8. | අධ්‍යාපන සහ පුහුණු | | 10 |
| 9. | මූල්‍ය මෙහෙයුම් සමාලෝචනය | | 11 |
| 10. | අරමුදල් සහ මූල්‍ය කළමනාකරණය | | 12 |
| 11. | 2012 වර්ෂය සඳහා වූ අවසන් ගිණුම් | | 13 |
| | i | මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය | 14 |
| | ii | මූල්‍ය කාර්ය සාධනය | 15 |
| | iii | ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය | 16 |
| | iv | මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 17 |
| | v | 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම්වලට අදාල සටහන් | 18 |
| | vi | 2012-12-31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා පොදු ගිණුම් ප්‍රතිපත්ති | 22 |
| 12. | විගණකාධිපති වාර්තාව | | 23 |

## 01 සභාපතිගේ පණිවුඩය

ඉඩම් මැනුම් සභාව
සර්වේයර් ජනරාල් කාර්යාලය
කිරුළ පාර, නාරාහේන්පිට
කොළඹ 05
2013 මාර්තු මස 01 වන දින

2012 වර්ෂය තුලදී ඉඩම් මැනුම් සභාවෙහි කාර්යයන් සාර්ථක ලෙස පවත්වාගෙන යාමට හැකියාව ලැබුණු බව සතුටින් දන්වා සිටිමි.

ඉඩම් මැනුම් සභාවේ පත්කරන ලද සාමාජිකයින්ගේ ධූරකාලය 2011-12-31 දිනෙන් අවසන් වීම නිසා ගරු ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් 2012-01-01 දින සිට වසර 3ක ධූරකාලයක් සඳහා නව සාමාජිකයින් පත්කරන ලදී. තවද, ඉඩම් මැනුම් සභාවේ පුරප්පාඩුව පැවති පරිගණක යෙදුම් සහකරු සහ ලිපිකරු තනතුර 2012 වසර තුළදී පිරවීමට හැකිවිය.

ඉඩම් මැනුම් සභාවට ඉඩ පහසුකම් සහිත කාර්යාල ගොඩනැගිල්ලක් තනා ගැනීමට බිම් කැබැල්ලක් ලබාදීමට සර්වේයර් ජනරාල්තුමා කැමැත්ත ප්‍රකාශ කර ඇති අතර එම පැවරීම් කටයුතු සඳහා අදාල ආයතන විසින් ක්‍රියා කරමින් පවතී.

සභාව 2003 වර්ෂයේදී ආරම්භ කිරීමෙන් පසු 2004 වර්ෂය අවසාන වනවිට මිනින්දෝරුවරුන් 1320 දෙනෙකු ලියාපදිංචි කර තිබූ අතර 2012 වර්ෂයේදී එම ප්‍රමාණය 1914 දක්වා වැඩිවී ඇත. ඉඩම් මැනුම් සභාව විසින් ප්‍රථම වරට වාර්ෂික මැනුම් බලපත්‍ර ලබාදෙන ලද්දේ 2004 වර්ෂයේදීය. එම වසරේ ලියාපදිංචි මිනින්දෝරුවරුන් 860 දෙනෙකුට වාර්ෂික මැනුම් බලපත්‍රය ලබා දුන් අතර 2012 වර්ෂයේදී වාර්ෂික මැනුම් බලපත්‍රය ලබාදුන් ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ සංඛ්‍යාව 1145 කි.

2012 වර්ෂය තුළදී රජයේ මිනින්දෝරුවරුන්ටද පෞද්ගලික මැනුම් කටයුතුවල යෙදීම සඳහා, ගරු ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යවරයාගේද, මැනුම් සභාවේද, අනුමැතිය ලැබිණ. ඒ අනුව, අයදුම්පත්‍ර ඉදිරිපත් කරන ලද රජයේ මිනින්දෝරුවරුන් 44 දෙනෙකු සඳහා බලපත්‍රය නිකුත් කළ අතර, කොළඹ දිසා අධිකරණයේ අංක. 98/12 දරණ නඩුවේ නියෝගය පරිදි රජයේ මිනින්දෝරුවරුන්ට බලපත්‍රය ලබාදීම තාවකාලිකව අත්හිටුවීම නිසා අනෙකුත් රජයේ මිනින්දෝරුවරුන්ගේ අයදුම්පත් රඳවා තබාගැනීමට සිදුවිය.

ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරුන්ට එරෙහිව සාමාන්‍ය ජනතාව මෙන්ම නොයෙකුත් ආයතන විසින් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන පැමිණිලි 70 ක කාර්යයන් 2012 වසර තුළදී අවසන් කළ හැකි වූ අතර ඒ සඳහා ඉඩම් මැනුම් සභාව විසින් මූලික විමර්ශන 11ක්ද විධිමත් පරීක්ෂණ 7ක්ද පවත්වා ඇත.

ඉඩම් මැනුම් සභාව පිහිටුවීමෙන් අනතුරුව අභිමුඛ වැඩමුළු තුළින් ලියාපදිංචි මිනින්දෝරුවරුන් අතර වෘත්තිමය විනය පවත්වාගෙන යාම සඳහා ඉඩම් මැනුම් සභාව විසින් සුවිශේෂී උනන්දුවක් දක්වා කටයුතු කර ඇත. පෙරවර්ෂවලදී මෙන්ම 2012 වර්ෂය තුළදී ද ප්‍රථම වතාවට බලයලත් මිනින්දෝරුවරුන් ලෙස ඉඩම් මැනුම් සභාවෙන් බලපත්‍රය ලබා ගත් මිනින්දෝවරුන් සඳහා අභිමුඛ වැඩමුළුවක් පවත්වන ලදී. අඛන්ඩ වෘත්තිය සංවර්ධනයේ අවශ්‍යතාවය සලකා බැලීමේදී, 2012 වර්ෂය තුලදී ඉඩම් මැනුම් ක්ෂේත්‍රයට සම්බන්ධ එවැනි පාඨමාලා 06ක් (අභිමුඛ වැඩමුළුද ඇතුළත්ව) ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවන් සඳහා ඉඩම් මැනුම් සභාවේ අනුමැතිය ඇතිව සිදුකරන ලදී. ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් විසින් වෘත්තීය අභිමුඛ වැඩමුළු හා අඛන්ඩ වෘත්තිය සංවර්ධන පාඨමාලා හැදෑරීමට දැක්වූ දැඩි උනන්දුව කැපී පෙනුනු කරුණක් විය.

ඉඩම් මැනුම් සභාවේ කාර්යයන් පහසුවෙන් කරගෙන යාමට දැඩි කැපවීමෙන් ක්‍රියා කරන ලද සභාවේ සාමාජිකයින්, වැඩ බලන ලේකම් හා කාර්ය මණ්ඩලය වෙත මගේ ස්තූතිය පුදකර සිටිමි.

එස්.එම්.ඩබ්.ප්‍රනාන්දු,
සභාපති / ඉඩම් මැනුම් සභාව.

# 02 දැක්ම හා මෙහෙවර

## දැක්ම

ඉඩම් මැනුම් සඳහා ක්‍රමවත් රාමුවක අඛන්ඩතාව පවත්වා ගනිමින් ජාතික සංවර්ධනය උදෙසා අපගේ භෞතික හා ස්වභාවික සම්පත් වල ප්‍රශස්ත හා තිරසාර උපයෝගිතාව තහවුරු කර ඒ තුළින් තරඟකාරි ගෝලීය වෙළඳපොළ තුල ගුණාත්මක මෙන්ම වෘත්තිය නිපුනත්වයෙන් යුත් මැනුම් සේවාවන් වෙත නාභිගත වි වෘත්තිය පරිසරය ශක්තිමත් කිරිම අපගේ දැක්මවේ.

## මෙහෙවර

මැනුම් වෘත්තිය හා එහි ව්‍යවහාරයන් ක්‍රමවත්ව පවත්වා ගන්නා බවටත් වෘත්තියෙන් බලාපොරොත්තු වන්නාවූ තාක්ෂණික නියමයන් සහ සදාචාරමය ප්‍රමිතීන් වලට එකඟ වන ලෙස පුහුණුවක් හා අධ්‍යාපනයක් වෘත්තීයට ප්‍රවේශවන්නන් වෙත ලැබෙන බවටත් එම නිසා වෘත්තියේ යෙදෙන්නන් විසින් වෘත්තිය පැවැත්මේ ඉහළම ප්‍රමිතීන් පවත්වාගනු ලබන බව තහවුරු කිරිම ඉඩම් මැනුම් සභාවේ මෙහෙවර වේ.

## 03 2002 අංක 17 දරණ මැනුම් පනතේ විධිවිධාන පරිදි ඉඩම් මැනුම් සභාවේ කාර්ය භාරයන්

2002 අංක 17 දරණ මැනුම් පනතේ විධිවිධාන පරිදි ඉඩම් මැනුම් සභාව 2003 වර්ෂයේදී පිහිටුවනු ලැබූ අතර එහි මෙහෙයුම් කටයුතු කොළඹ 05, කිරුළ පාරේ, අංක 150 දරණ ස්ථානයේ පිහිටි සර්වේයර් ජනරාල් කාර්යාලයේ පළමු මහලේදී ආරම්භ කරන ලදී.

උක්ත පනතේ 37 වන වගන්තියේ දක්වා ඇති පරිදි සභාවේ කාර්යයන් පහත පරිදිවේ.

(අ) ඉඩම් මැනීමට අදාළ ප්‍රමිති හා කාර්ය පටිපාටිය පවත්වා ගෙන යාම හා ඉඩම් මැනිමේ කටයුතුවල යෙදී සිටින තැනැත්තන් අතර වෘත්තියමය විනය පවත්වාගෙන යාම;

(ආ) ලියාපදිංචි මිනින්දෝරුවරු ලෙස ලියාපදිංචි කිරීම සඳහා මිනින්දෝරුවන්ගෙන් ඉල්ලුම් පත්‍ර භාරගැනීම සහ ඒ මිනින්දෝරුවරුන්ට ඉඩම් මැනිමේ කටයුතු කරගෙන යාම සඳහා නියමිත සුදුසුකම් සහ පළපුරුද්ද සහ හැකියාව සහ නිපුණතාවය ඇති බවට සභාව සෑහීමකට පත්වන අවස්ථාවන්හිදි ඔවුන් ලියාපදිංචි කිරීම;

(ඇ) වාර්ෂික වෘත්තියමය බලපත්‍ර නිකුත් කිරීම සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගෙන් ඉල්ලුම්පත් භාර ගැනිම සහ එවැනි මිනින්දෝරුවන්ට ඉඩම් මැනිමේ වෘත්තිය කරගෙනයාම සඳහා දැනුම සහ නිපුණතාවය ඇති බවට සභාව සෑහිමකට පත්වන අවස්ථාවන්හිදී එවැනි බලපත්‍ර නිකුත් කිරීම;

(ඈ) ඉඩම් මැනිමේ යෙදී සිටින තැනැත්තන් අතර වෘත්තියමය අධ්‍යාපනය පිළිබඳ උසස් ප්‍රමිතීන් පවත්වාගෙන යාම ප්‍රවර්ධනය කිරීම;

(ඉ) මිනින්දෝරු වෘත්තියේ යෙදී සිටින හා වාර්ෂික වෘත්තියමය බලපත්‍ර ලබාගැනිමට නියම කරන ලද තැනැත්තන්ගේ දැනුම හා දක්ෂතා වැඩිදියුණු කිරිමේ කාර්ය සඳහා වෘත්තියමය සංවර්ධන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම;

(ඊ) ඉඩම් මැනිම පිළිබඳ ශාස්ත්‍රීය හා වෘත්තියමය සුදුසුකම් පිළිගැනිම, ප්‍රායෝගික පළපුරුද්ද පිළිබඳ අවශ්‍යතා නියම කිරීම සහ ලියාපදිංචි මිනින්දෝරුවන් ලෙස ලියාපදිංචි වීමට සහ වාර්ෂික වෘත්තිමය බලපත්‍ර නිකුත් කිරීම සඳහා වූ අපේක්ෂකයන් වෙනුවෙන් සුදුසුකම් ලැබිමේ විභාග හා වෘත්තියමය සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම;

(උ) ඉඩම් මැනිමෙහි යෙදී සිටින තැනැත්තන්ගේ අධ්‍යාපනය, පුහුණුව හා පිළිගැනිම යන කරුණු වලදී සම තත්වයක් හා අන්‍යොන්‍යතාවයක් ස්ථාපිත කිරීම සඳහා විදේශීය රටවල බලධරයන් සමග අන්‍යොන්‍ය වැඩ පිළිවෙලවල් සඳහා එකඟතාවය ඇතිකර ගැනිම හා ක්‍රියාත්මක කිරීම;

(ඌ) නියම කරන ලද අධ්‍යාපන ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකාවේ ඉඩම් මැනුම් කටයුතු හා ඉඩම් තොරතුරු පිළිබඳව නියැලි සිටින ආයතන සමග සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම;

(එ) උසස් වෘත්තියමය ප්‍රමිතීන් පවත්වාගෙන යාමේදී ශ්‍රී ලංකාවේ වෙනත් අදාළ සංවිධාන සමග සම්බන්ධීකරණය කිරීම;

## 04 ඉඩම් මැනුම් සභාවේ බලතල

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනිම, දැරීම, බද්දට ගැනිම හෝ බද්දට දීම, උකස් කිරිම, ඔඩපනය කිරිම, විකිණිම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරිම.

(ආ) මුදලින් හෝ අන්‍යාකාරයේ වූ ත්‍යාග ප්‍රදාන හෝ පරිත්‍යාග භාර ගැනිමට සහ ස්වකීය කර්තව්‍ය ඉටු කිරිම සඳහා ඒවා යොදා ගැනිම.

(ඇ) සභාවේ කටයුතු කරගෙන යාමට අවශ්‍ය නිලධරයන් හා සේවකයන් පත් කිරිම.

(ඈ) එසේ පත්කරන ලද නිලධරයන්ට හා සේවකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමිකය තීරණය කිරිම.

(ඉ) ස්වකීය කර්තව්‍යයන් ඵලදායි ලෙස ඉටුකිරිම සඳහා කමිටු පත් කිරිම.

(ඊ) ස්වකීය නිලධරයන් හා සේවකයන් සඳහා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක් පිහිටුවීම හා සුභසාධන හා ක්‍රීඩා පහසුකම් සැපයීම.

(උ) සභාවේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් නීති සෑදීම.

(ඌ) සාමාන්‍යයෙන් සභාවේ කර්තව්‍ය නිසිපරිදි ඉටුකිරිම පහසු කරලීම සඳහා අවශ්‍යවන වෙනත් සියලු දේ කිරිම.

## 05 2012 වසර තුළ ඉඩම් මැනුම් සභාවේ කාර්යසාධනය පිළිබඳ වාර්තාව

**2012 දෙසැම්බර් 31 වන දිනට ඉඩම් මැනුම් සභා සාමාජිකයන්:**

| | | |
|---|---|---|
| i. | එස්.එම්.ඩබ්.ප්‍රනාන්දු මහතා | - සභාපති |
| ii. | ආචාර්ය කේ.තවලිංගම් මහතා | - උප සභාපති |
| iii. | ඩබ්. ඒ. එස්. වික්‍රමාරච්චි මහතා | - සාමාජික |
| iv. | ආචාර්ය කේ. ආර්. එම්. යූ. බණ්ඩාර මහතා | - සාමාජික |
| v. | සී. ද එස්. ගුණතිලක මහතා | - සාමාජික |
| vi. | ජෙරල්ඩ් ඒ ද සිල්වා මහතා | - සාමාජික |
| vii. | කේ. ඒ. එම්. ද අල්විස් මහතා | - සාමාජික |
| viii. | තිමාලි ද සිල්වා මෙනවිය | - නිරික්ෂක/භාණ්ඩාගාර නියෝජිත |

**සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය සඳහා වූ ඉඩම් මැනුම් සභා සාමාජිකයන්:**

| | | |
|---|---|---|
| i | එස්.එම්.ඩබ්.ප්‍රනාන්දු මහතා (සභාපති) | - 2009-02-04 සිට මේ දක්වා |
| ii | ආචාර්ය කේ.තවලිංගම් මහතා (උප සභාපති) | - 2009-02-04 සිට මේ දක්වා |
| iii | ඩබ්.ඒ.එස්. වික්‍රමාරච්චි මහතා (සාමාජික) | - 2011-07-19 සිට මේ දක්වා |
| iv | ආචාර්ය කේ. ආර්. එම්. යූ. බණ්ඩාර මහතා (සාමාජික) | - 2012-01-01 සිට මේ දක්වා |
| v | සී. ද එස්. ගුණතිලක මහතා (සාමාජික) | - 2012-01-01 සිට මේ දක්වා |
| vi | ජෙරල්ඩ් ඒ ද සිල්වා මහතා (සාමාජික) | - 2012-01-01 සිට මේ දක්වා |
| vii | කේ. ඒ. එම්. ද අල්විස් මහතා (සාමාජික) | - 2012-01-01 සිට මේ දක්වා |
| viii | තිමාලි ද සිල්වා මෙනවිය /(භාණ්ඩාගාර නියෝජිත) | - 2010-09-27 සිට මේ දක්වා |

**මැනුම් සභා රැස්වීම් වාර සඳහා සහභාගීත්වය:**

| | | | |
|---|---|---|---|
| i. | එස්.එම්.ඩබ්.ප්‍රනාන්දු මහතා | - සභාපති | - රැස්වීම් වාර 14 |
| ii. | ආචාර්ය කේ.තවලිංගම් මහතා | - උප සභාපති | - රැස්වීම් වාර 14 |
| iii. | ඩබ්.ඒ.එස්. වික්‍රමාරච්චි මහතා | - සාමාජික | - රැස්වීම් වාර 14 |
| iv. | ආචාර්ය කේ. ආර්. එම්. යූ. බණ්ඩාර මහතා | - සාමාජික | - රැස්වීම් වාර 10 |
| v. | සී. ද එස්. ගුණතිලක | - සාමාජික | - රැස්වීම් වාර 14 |
| vi. | ජෙරල්ඩ් ඒ ද සිල්වා මහතා | - සාමාජික | - රැස්වීම් වාර 13 |
| vii. | කේ. ඒ. එම්. ද අල්විස් මහතා | - සාමාජික | - රැස්වීම් වාර 14 |
| viii. | තිමාලි ද සිල්වා මෙනවිය | - භාණ්ඩාගාර නියෝජිත | - රැස්වීම් වාර 12 |

## 06 ඉඩම් මැනුම් සභා කාර්ය මණ්ඩලය:

| | | |
|---|---|---|
| i | ජී.ඩී.එස්.කේ.ගුණරත්න මහතා - ලේකම් (වැ.බ.) | - 2009-01-01 සිට මේ දක්වා |
| ii | රංජිත් මහකුඹුර මහතා - ගණකාධිකාරි (අර්ධ කාලීන පදනම මත) | - 2008-03-01 සිට මේ දක්වා |
| iii | ඩබ්.ඒ.එස්.ප්‍රියදර්ශනී මෙනවිය පරිගණක යෙදවුම් සහකාර සහ ලිපිකරු | - 2004-05-24 සිට මේ දක්වා |
| iv | පී. සී. ලියනගේ මහතා පරිගණක යෙදවුම් සහකාර සහ ලිපිකරු | - 2012-03-16 සිට 2013-02-28 දක්වා |
| v | ටී.ජී.ප්‍රනාන්දු මහතා - කාර්යාල කාර්ය සහායක | - 2004-07-15 සිට මේ දක්වා |

## 07 කාර්යයන්

### ලියාපදිංචිය:

සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ මිනින්දෝරුවන් 55 දෙනෙකු අලුතින් ලියාපදිංචි වී ඇති අතර 2012-12-31 වන දිනට ලියාපදිංචි වූ මුළු මිනින්දෝරුවරුන්ගේ ගණන 1914 කි. මෙම මිනින්දෝරුවන් සඳහා ලියාපදිංචි සහතික ලබා දී ඇත.


### වාර්ෂික වෘත්තියේ යෙදීමේ බලපත්‍ර:

වාර්ෂික බලපත්‍ර ලබාගත් ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ සංඛ්‍යාව සමාලෝචිත කාල පරිච්ඡේදයේදී 1145 කි. (රජයේ නොවන මිනින්දෝරුවරු-1101, රජයේ මිනින්දෝරුවරු-44)

2012- මාර්තු මස 13 වන දින වනවිට වාර්ෂික මැනුම් බලපත්‍ර ලබාගත් ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ මුලකුරු සමග නම්, ලියාපදිංචි අංක සහ ජාතික හැඳුනුම්පත් අංක සමග 2012 අප්‍රේල් 05 දින පල වූ අංක 1753 දරණ ගැසට් පත්‍රයේ විධිමත් ලෙස ප්‍රසිද්ධියට පත් කරනු ලැබීය.

සියලුම බලයලත් මිනින්දෝරුවරුන්ගේ විස්තර - ලියාපදිංචි අංක, මුලකුරු සමග නම්, සම්පූර්ණ නම්, ජාතික හැඳුනුම්පත් අංක, දිස්ත්‍රික්කයේ නම, ලිපිනයන්, දුරකථන අංක, වාර්ෂික බලපත්රයේ අංකය, බලපත්‍රය වලංගු කාලය ඇතුළත් තොරතුරු www.survey.gov.lk යන වෙබ් අඩවියට ඇතුළත් කරනු ලැබ ඇත. එහි සඳහන් තොරතුරු සෑම මාස තුනකට වරක් යාවත්කාලීන කෙරේ.

**2011/2012 වසර තුළ නිකුත් කරනු ලැබූ මුළු බලපත්‍ර සංඛ්‍යාව**




## මහජනතාව සඳහා තොරතුරු

මහජනතාව, ඉඩම් මැනුම් සභාව විසින් සපයන සේවාවන් පිළිබඳව දැනුවත් වී සිටින බැවින් බලයලත් මිනින්දෝරුවරුන් විසින් වසර සියයකට පමන පෙර සිට සකසන ලද මුල් මැනුම් පිඹුරුවල පිටපත් ලබා ගැනිම සඳහා බලයලත් මිනින්දෝරුවරුන් ජිවත්ව සිටිනවාද, මියගොස්ද යන තොරතුරු ලබාගැනීමට නිතරම සහය පතයි. එවැනි තොරතුරු අප්‍රමාදව සැපයීමේ අදහස ඇතිව බලයලත් මිනින්දෝරුවරුන්ගේ අදාල පුද්ගලික ලිපිනයන්, ලියාපදිංචි අංක හා බලපත්‍ර අංක වලින් තොරතුරු අන්තර්ගත කිරිම සඳහා දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම සම්පූර්ණ කර ඇත. 2004 වසරට පෙර බලයලත් මිනින්දෝරුවරුන් පිළියෙල කළ මුල් පිඹුරු පිටපත් ලබාගැනිමට උදව් විය හැකි පුද්ගලයින් සමග සම්බන්ධවීමට මහජනතාවට ප්‍රවේශ වියහැකි හැකිවන පරිදි ඔවුන්ගේ දුරකථන අංකද ඇතුලත්කර මෙය යාවත්කාලීන කරනු ලැබේ. එසේ වුවත්, මේ වනතුරු පිඹුරු ක්‍රමානුකූලව ඔවුන්ට ලබා ගැනිමට පූර්ණ වශයෙන්ම සහාය වීමට නොහැකිවීම නිසා මෙම සේවාවන් පිළිබඳව ඉඩම් මැනුම් සභාව සෑහීමකට පත් නොවේ. සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ එවැනි විමසීම් 234 ක් සිදුකර තිබේ.

## ඉඩම් මැනුම් සභාවට මහජනතාවගෙන් ලැබී ඇති පැමිණිලි:

**නිරාකරණය කරන ලද මුළු පැමිණිලි සංඛ්‍යාව**




වෘත්තීය විෂමාචාරයේ යෙදී ඇති බවට චෝදනා ලබා ඇති බලයලත් මිනින්දෝරුවරුන් සම්බන්ධව පැමිණිලි 79 ක් 2012 වසර තුළදී මහජනයාගෙන් ලැබී තිබිණි. ඒ සම්බන්ධව මුලික විමර්ශන 11 ක් ඉඩම් මැනුම් සභාව සිදු කළ අතර අවශ්‍ය අවස්ථාවලදී ඉඩම් මැනුම් සභාවේ තීරණය පරිදි, විධිමත් පරීක්ෂණ සිදු කරනු ලැබීය. මෙලෙස සමාලෝචිත වසර තුළදී විධිමත් පරීක්ෂණ 7 ක් පවත්වන ලදී. 2012 වසර තුළදී, එවැනි පැමිණිලි 70 ක කාර්යයන් අවසන් කළ හැකි වූ අතර වසර අවසාන වන විට පැමිණිලි 18 ක් පමණක් නොවිසඳී පැවතුණි.

සභාව විසින් පැවැත්වූ පරීක්ෂණවලින් අනතුරුව, ඉඩම් මැනුම් සභාවේ අධීක්ෂණය යටතේ අදාල මිනින්දෝරුවරුන් සහ පැමිණිලිකරුවන් සමථයකට පත්ව අදාල ගැටළුව විසඳා ගැනීමෙන් පැමිණිලි 4කද, මිනින්දෝරුවරුන් සඳහා අවවාද කිරීමෙන් අනතුරුව පැමිණිලි 16කද විභාගය අවසන් කරන ලදී. කෙසේ වෙතත් තවත් පැමිණිලි 26කදී ඉඩම් මැනුම් සභාවට පෙනී ගියේ අදාල මිනින්දෝරුවරයා විසින් වෘත්තීයමය විෂමාචාරයක් සිදුවූ බවට සනාථ කිරීමට ප්‍රමාණවත් කරුණු පැමිණිලිකරුවන් විසින් ඉදිරිපත් කර නොමැති බවය.

පැමිණිලි පිළිබඳ පැමිණිලිකරුවන්ගේ උනන්දුවක් නොමැති වූ අවස්ථාවලදී "එම පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියා කිරීම අත්හිටුවන බව" ඔවුන් වෙත දන්වා, පැමිණිලි 2ක් අවසන් කිරීමට සිදුවිය.

පැමිණිලි පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති චෝදනාවන් 2002 අංක 17 දරන මැනුම් පනතේ විධිවිධාන අනුව ඉඩම් මැනුම් සභාවට පැවරී ඇති විෂය පථයෙන් බැහැර බැවින් පැමිණිලි 6ක් විභාග කල නොහැකි බව දන්වා සිටි අතර සර්වේයර් ජනරාල් වෙත තවත් එවැනි එක් පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත.

අධිකරණයේ නියෝග මත, ගරු අධිකරණයේ ලියාපදිංචි උසාවි කොමසාරිස්වරයෙකු වශයෙන් කරන ලද මැනීම් සම්බන්ධයෙන් පැමිණිලි අධිකරණය වෙත ඉදිරිපත් කල යුතු බව දන්වා පැමිණිලි 4ක්ද ගරු අධිකරණය විසින් විභාග කිරීමට නියමිත නඩුවක් සම්බන්ධයෙන් හෝවිභාග කරමින් පවතින නඩුවක් සම්බන්ධයෙන් හෝ විභාග කොට ලබාදුන් අවසන් තීන්දුවක් සම්බන්ධයෙන් හෝ ඉඩම් මැනුම් සභාවට ක්‍රියා කල නොහැකි බව දන්වා පැමිණිලි 13ක්ද අවසන් කරන ලදී.

## 08 අධ්‍යාපන හා පුහුණු

<u>අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා</u>

අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය ඉඩම් මැනීමේ ප්‍රධාන අංගයකි. ඉඩම් මැනුම් සභාව මේ පිළිබඳව දැනුවත්ව සිටින බැවින් මැනුම් වෘත්තිකයින් විසින් ඉඩම් මැනුම් ක්ෂේත්‍රයට හඳුන්වාදුන් නව තාක්ෂණයේ වර්තමාන සංවර්ධනයට අනුරූපවන්නාවූ පුහුණු පාඨමාලා හැදෑරීමට ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් ධෛර්යමත් කර ඇත.

2009 වසරේ ඉඩම් මැනුම් සභාව පළමු දුරස්ථ අධ්‍යාපන වැඩ සටහන (DEP) ආරම්භ කළ අතර 2010 වසරේදීද එලෙසම දුරස්ථ අධ්‍යාපන වැඩසටහන් නොකඩවා පවත්වාගෙන යාමත්, බලයලත් මිනින්දෝරුවරුන් ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය හා එහි සාමාජිකයින් මගින් ධෛර්යමත් කළ අතර අනෙකුත් බලයලත් මිනින්දෝරුවන් දුරස්ථ අධ්‍යාපන වැඩසටහන යටතේ හඳුන්වාදුන් පළමු වැඩසටහන් දෙක වූ වෘත්තිය පරිචය I හා වෘත්තිය පරිචය II පාඨමාලා හැදෑරීය. මෙම පාඨමාලා සඳහා සහභාගීවූවන්ට සහතිකපත් ලබාදී ඇත. කෙසේ වෙතත් 2012 වර්ෂයේදී දුරස්ථ අධ්‍යාපන වැඩ සටහන් ක්‍රියාත්මක නොවීය.

### ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව සහ දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරු සංගම් මගින් පවත්වනු ලබන අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා (CPD)

ඉඩම් මැනුම් සභාවේ මග පෙන්වීම යටතේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය ලබාගැනීමේ අදහස ඇතිව ලියාපදිංචි මිනින්දෝරුවරුන්ට සහ ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන්ට අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා පැවැත්වීමට බලවත් උනන්දුවක් දැක්වූ ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව සහ දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරු සංගම් (ගම්පහ සහ කොළඹ) යන ආයතන පිළිබඳව ඉඩම් මැනුම් සභාව සතුටින් සඳහන් කරයි.

### මුල්වරට බලපත්‍ර ලබාගත් මිනින්දෝරුවරුන් සඳහා වූ වැඩමුළුව (අභිමුඛ වැඩමුළුව)


තම ජීවිත ගමන වෘත්තීය මිනින්දෝරුවරයකු ලෙස ආරම්භ කිරීම සඳහා ප්‍රථම වතාවට ඉඩම් මැනුම් සභාවෙන් වාර්ෂික වෘත්තියේ යෙදීමේ බලපත්‍රය ලබාගෙන සිටින මිනින්දෝරුවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පෙරවර්ෂවලදී මෙන්ම අභිමුඛ වැඩමුළුවක් පවත්වනු ලැබිය. පුළුල් අත්දැකීම් සහිත, විශිෂ්ඨ හැකියාවන්ගෙන් යුත් ප්‍රකට ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන්වූ සම්පත්දායිකයින් එකී ලියාපදිංචි මිනින්දෝරුවරුන් දැනුවත් කිරිම සඳහා තෝරාගනු ලැබීය.

**පැවැත්වූ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා පිළිබඳ සාරාංශය**

| | ආයතනයේ නම | අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලාවේ නම් | පාඨමාලාව පැවැත්වූ දිනය |
|---|---|---|---|
| 1. | ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව | තාක්‍ෂණික වැඩමුළුව | 2012-04-12 |
| 2. | ගම්පහ දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරු සංගමය | තක්සේරුකිරීම පිළිබඳ දැනුවත්කිරීමේ පාඨමාලාව | 2012-06-29 |
| 3. | ගම්පහ දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරු සංගමය | සහාධිපත්‍ය පිඹුරු පිළිබඳ වැඩමුළුව | 2012-07-14 |
| 4. | කොළඹ දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරු සංගමය | සහාධිපත්‍ය පිඹුරු හා උසාවි කොමිෂම් මැනුම් පිළිබඳ වැඩමුළුව | 2012-07-14 |
| 5. | ඉඩම් මැනුම් සභාව | අභිමුඛ වැඩමුළුව | 2012-07-16 |
| 6. | ඉඩම් මැනුම් සභාව | තාක්‍ෂණික වැඩමුළුව | 2012-09-16 |

## 09 මූල්‍ය මෙහෙයුම් සමාලෝචනය

**මුළු ආදායම - 2011 / 2012**




රුපියල් 3,658,303 ක් වූ පෙර වර්ෂයේ ජනනය කරන ලද ආදායමට සාපේක්ෂව ඉඩම් මැනුම් සභාවේ මුළු ආදායම රු. 4,660,100 ක් වේ.

එමෙන්ම අදාළ කාල පරිච්ඡේදය තුළ සභාවේ වියදම රු. 3,230,527 ක් වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස රු. 1,429,573 ක අතිරික්තයක් පැවතිණ.

2010 සහ 2011 වර්ෂවලදී මෙන්ම 2012 වර්ෂය සඳහාද මහා භාණ්ඩාගාරයෙන් අරමුදල් සපයා නොමැත. 2012 වසර සඳහා ප්‍රාග්ධන වියදම් රු. 85,000 ක් විය.

## 10 අරමුදල් සහ මූල්‍ය කළමනාකරණය

ඉඩම් මැනුම් සභාවේ ආදායම ප්‍රධාන වශයෙන්, වාර්ෂික වෘත්තියේ යෙදීමේ බලපත්‍ර ගාස්තු, අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා පැවැත්වීම සඳහා අය කිරීම් සහ විධිමත් පරීක්ෂණ පැවැත්වීමට දැරූ වියදම වැරදිකරුවන්වූ ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගෙන් අයකර ගැනීම් මගින් රැස් කෙරේ.

2012-12-31 වන දිනට රුපියල් 8,967,376 ක මුදලක් ලංකා බැංකුවේ ස්ථාවර ගිණුම්වල තැන්පත් කර ඇත.

**11**

# 2012 වර්ෂය සඳහා වූ අවසන් ගිණුම්

**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**
**ඉඩම් මැනුම් සභාව**

## 2012 දෙසැම්බර් 31 වන දිනට
## මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය

| විස්තරය | සටහන | 2012 | | 2011 | |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| **වත්කම්** | | | | | |
| **ජංගම වත්කම්** | | | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 1 | 7,789,377 | | 6,215,149 | |
| ලැබිය යුතු දෑ | 2 | 101,363 | | 166,517 | |
| ආපදා ණය | | 395,051 | | 262,120 | |
| උත්සව අත්තිකාරම් | | 2,000 | 8,287,791 | 2,000 | 6,645,786 |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| ස්ථාවර තැන්පතු | 3 | 1,177,999 | | 1,293,728 | |
| යන්ත්‍ර හා යත්ත්‍රෝපකරණ | 4 | 412,861 | 1,590,860 | 417,894 | 1,711,622 |
| **මුළු වත්කම්** | | | 9,878,651 | | 8,357,408 |
| **වගකීම්** | | | | | |
| **ජංගම වගකීම්** | | | | | |
| කලින් ලැබී ඇති බලපත්‍ර ගාස්තු | | 2,541,650 | | 2,593,430 | |
| ගෙවිය යුතු දෑ | 5 | 250,250 | | 204,000 | |
| උපචිත වියදම් | 6 | 295,703 | 3,087,603 | 172,743 | 2,970,173 |
| **ජංගම නොවන වගකීම්** | | | - | | - |
| **මුළු වගකීම්** | | | 3,087,603 | | 2,970,173 |
| **ශුද්ධ වත්කම්** | | | 6,791,048 | | 5,387,235 |
| **ශුද්ධ වත්කම්/හිමිකම්** | | | | | |
| **ප්‍රාග්ධන සැපයුම** | | | | | |
| මහා භාණ්ඩාගාරය | | 1,043,030 | | 1,043,030 | |
| සමුච්චිත අරමුදල | 7 | 4,318,445 | | 3,293,408 | |
| අතිරික්තය/හිඟය | | 1,429,573 | | 1,050,797 | |
| **මුළු ශුද්ධ වත්කම්/හිමිකම්** | | | 6,791,048 | | 5,387,235 |

කේ. තවලිංගම්
උප සභාපති
ඉඩම් මැනුම් සභාව

එස්. එම්. ඩබ්ලිව්. ප්‍රනාන්දු
සභාපති
ඉඩම් මැනුම් සභාව

**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**
**ඉඩම් මැනුම් සභාව**

# 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
# මූල්‍ය කාර්යසාධනය

| විස්තරය | සටහන | 2012 | | 2011 | |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| **ආදායම්** | | | | | |
| බලපත්‍ර ගාස්තුව | | 3,314,530 | | 2,762,500 | |
| ලියාපදිංචි ගාස්තුව | | 199,500 | | 3,500 | |
| වෙනත් ආදායම් | 8 | 1,146,070 | | 892,303 | |
| මුළු ආදායම | | | 4,660,100 | | 3,658,303 |
| **වියදම්** | | | | | |
| **<u>පෞද්ගලික පඩිනඩි</u>** | | | | | |
| වැටුප් හා වේතන | 9 | 802,122 | | 637,839 | |
| අතිකාල හා නිවාඩු දින දීමනා | | - | | 33,300 | |
| වෙනත් දීමනා | 10 | 1,003,329 | (1,805,451) | 664,777 | (1,335,916) |
| **<u>ගමන් වියදම්</u>** | | | | | |
| දේශීය | | | (8,532) | | (16,533) |
| **<u>සැපයුම්</u>** | | | | | |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | | 131,364 | | 107,504 | |
| වෙනත් | 11 | 41,119 | (172,483) | 42,494 | (149,998) |
| **<u>නඩත්තු වියදම්</u>** | | | | | |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | | | (9,500) | | (17,288) |
| **<u>සේවා</u>** | | | | | |
| තැපැල් හා සන්නිවේදන | | 108,976 | | 154,880 | |
| විදුලිය හා ජලය | 12 | 78,734 | | 78,734 | |
| වෙනත් | 13 | 956,818 | (1,144,528) | 769,232 | (1,002,846) |
| ක්ෂයවීම | | | (90,033) | | (84,925) |
| මුළු වියදම් | | | (3,230,527) | | (2,607,506) |
| **කාලසීමාවට අදාල අතිරික්තය/ඌනතාව** | | | **1,429,573** | | **1,050,797** |

කේ. තවලිංගම්
උප සභාපති
ඉඩම් මැනුම් සභාව

එස්. එම්. ඩබ්ලිව්. ප්‍රනාන්දු
සභාපති
ඉඩම් මැනුම් සභාව

**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**
**ඉඩම් මැනුම් සභාව**

## 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## ස්කන්ධය වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය

| විස්තරය | ප්‍රාග්ධන ප්‍රදාන | සමුච්චිත අරමුදල/ඌනතාවය | එකතුව |
|---|---|---|---|
| 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,043,030 | 4,318,445 | 5,361,475 |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/හිඟය | | 1,429,573 | 1,429,573 |
| 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,043,030 | 5,748,018 | 6,791,048 |

**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**
**ඉඩම් මැනුම් සභාව**

# 2012 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා
# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විස්තරය | සටහන | 2012 | | 2011 | |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| <u>මෙහෙයුම් කටයුතුවලින් මුදල්ප්‍රවාහ</u> | | | | | |
| අතිරික්තය/(ඌනතාවය) | | 1,429,573 | | 1,050,797 | |
| <u>මුදල් නොවන සංචලනයන්</u> | | | | | |
| ක්ෂයවීම | | 90,033 | | 84,925 | |
| ස්ථාවර තැන්පතු පොළිය | | (732,907) | | (391,289) | |
| ආපදා ණය (වැඩිවීම)/අඩුවීම | | (132,931) | | 66,180 | |
| ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම | | 65,154 | | (157,779) | |
| ගෙවිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම | | 46,250 | | (46,500) | |
| කලින් ලැබුණ බලපත්‍ර ගාස්තුව වැඩිවීම/(අඩුවීම) | | (51,780) | | 100,030 | |
| උපචිත වියදමෙහි වැඩිවීම/(අඩුවීම) | | 122,960 | | 77,765 | |
| අවිනිශ්චිත ගිණුමෙහි වැඩිවීම/(අඩුවීම) | | - | | (5,850) | |
| **මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | | | 836,352 | | 778,279 |
| <u>ආයෝජන කටයුතු වලින් ජනනය වූ මුදල් පුවාහ</u> | | | | | |
| ස්ථාවර තැන්පතු | | 115,729 | | 4,387,303 | |
| ස්ථාවර තැන්පතු පොලිය | | 732,907 | | 391,289 | |
| ස්ථාවර වත්කම් මිළදී ගැනීම | | (85,000) | | (259,690) | |
| **මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | | | 763,636 | | 4,518,902 |
| <u>මූල්‍ය කටයුතු වලින් මුදල් ප්‍රවාහ</u> | | | | | |
| සමුච්චිත අරමුදල | | | (25,760) | | - |
| මුදල් හා මුදල් සමාන දෑ වල දළ වැඩිවීම /(අඩුවීම) | | | 1,574,228 | | 5,297,181 |
| කාලසීමාව ආරම්භයේ මුදල් හා මුදල් සමාන දේ | | | 6,215,149 | | 917,968 |
| කාලසීමාව අවසානයේ මුදල් හා මුදල් සමානදේ | 1 | | 7,789,377 | | 6,215,149 |

කේ. තවලිංගම්
උප සභාපති
ඉඩම් මැනුම් සභාව

එස්. එම්. ඩබ්ලිව්. ප්‍රනාන්දු
සභාපති
ඉඩම් මැනුම් සභාව

2012-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම් වලට අදාළ සටහන්

## ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය
## ඉඩම් මැනුම් සභාව

**1 මුදල් හා මුදල් සමාන දෑ**

| | | | | | |
|---|---|---|---|---|---|
| | අතැති මුදල | | | | 3,455 |
| | බැංකුවේ ඇති මුදල | | | | 143,253 |
| ස්ථාවර තැන්පතු | | | | | |
| අනු අංකය | බැංකුව | කාල සීමාව | ගිණුම් අංකය | වටිනාකම | |
| 1 | ලංකා බැංකුව, නාරාහෙන්පිට | 3 මාස | 7256887 | 2,000,000 | |
| 2 | ලංකා බැංකුව, නාරාහෙන්පිට | 1 මාස | 8737776 | 684,418 | |
| 3 | ලංකා බැංකුව, නාරාහෙන්පිට | 3 මාස | 70070797 | 1,842,855 | |
| 4 | ලංකා බැංකුව, නාරාහෙන්පිට | 3 මාස | 71352557 | 115,396 | |
| 5 | ලංකා බැංකුව, නාරාහෙන්පිට | 3 මාස | 72854722 | 1,000,000 | |
| 6 | ලංකා බැංකුව, නාරාහෙන්පිට | 3 මාස | 74176142 | 1,500,000 | |
| 7 | ලංකා බැංකුව, නාරාහෙන්පිට | 3 මාස | 74176180 | 500,000 | 7,642,669 |
| | | | | | 7,789,377 |

**2 ලැබිය යුතු දෑ**

| | |
|---|---|
| ලැබිය යුතු පොලී ආදායම | 101,363 |
| | 101,363 |

**3 ස්ථාවර තැන්පතු**

| අනු අංකය | බැංකුව | ගිණුම් අංකය | වටිනාකම |
|---|---|---|---|
| 1 | ලංකා බැංකුව, නාරාහෙන්පිට | 71352120 | 1,177,999 |
| | | | 1,177,999 |

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය
ඉඩම් මැනුම් සභාව

4 - යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ

| අයිතම | 2012-01-01 දිනට ශේෂය රු. | වර්ෂය තුළදී මිළදී ගැනීම රු. | එකතුව රු. | ක්ෂය වීම % | වාර්ෂික ක්ෂයවීම රු. | 2012-12-31 දිනට ශුද්ධ වටිනාකම |
|---|---|---|---|---|---|---|
| යන්ත්‍රෝපකරණ | 161,811 | - | 161,811 | 20 | 32,362 | ***129,449*** |
| ගෘහභාණ්ඩ | 184,001 | - | 184,001 | 10 | 18,400 | ***165,601*** |
| පරිගණක | 57,452 | 85,000 | 142,452 | 25 | 35,613 | ***106,839*** |
| කාර්යාලීය උපකරණ | 14,630 | - | 14,630 | 25 | 3,658 | ***10,972*** |
| **Total** | **417,894** | **85,000** | **502,894** | | **90,033** | **412,861** |

**5 ගෙවිය යුතු දෑ**

| | |
|---|---|
| ගෙවිය යුතු මුද්දර බද්ද | 250,250 |
| | 250,250 |

**6 උපචිත වියදම්**

| අනු අංකය. | වියදම් | රු. |
|---|---|---|
| 1 | වැටුප් සහ වේතන | 16,000 |
| 2 | දුරකතන | 2,248 |
| 3 | වැඩමුළු සඳහා වියදම් | 7,000 |
| 4 | සේවක ගමන් වියදම් | 455 |
| 5 | විගණන ගාස්තු | 270,000 |
| **එකතුව** | | **295,703** |

**7 සමුච්ඡිත අරමුදල**

| | |
|---|---|
| සමුච්චිත අරමුදල | 4,344,205 |
| ද්වීගණනය වූ පොළිය නිවැරදි කිරීම | (25,760) |
| | **4,318,445** |

**8 වෙනත් ආදායම්**

| | |
|---|---|
| වෙනත් | 399,652 |
| ස්ථාවර තැන්පතු සඳහා පොළිය | 732,907 |
| සේවක ණය පොළිය | 13,511 |
| | **1,146,070** |

**9 වැටුප් හා වේතන**

| | |
|---|---|
| වැටුප් හා වේතන | 679,591 |
| සේවක අර්ථසාධක අරමුදලේ දායකත්ව මුදල | 98,025 |
| සේවක භාරකාරත්ව අරමුදලේ දායකත්ව මුදල | 24,506 |
| | **802,122** |

**10 වෙනත් දීමනා**

| | |
|---|---|
| ජීවන වියදම් දීමනා | 195,692 |
| විශේෂ දීමනා | 83,242 |
| සභාපතිගේ කාර්ය දීමනා | 300,000 |
| උප සභාපතිගේ කාර්ය දීමනා | 240,000 |
| වැඩබලන ලේකම්වරයාගේ කාර්ය දීමනා | 115,590 |
| ගණකාධිකාරීගේ කාර්ය දීමනා | 68,805 |
| | **1,003,329** |

**<u>සැපයුම්</u>**

**11 වෙනත්**

| | |
|---|---|
| රැස්වීම් සඳහා අහාරපාන | 41,119 |

**12 විදුලිය හා ජලය**

| | |
|---|---|
| විදුලිය | 74,534 |
| ජලය | 4,200 |
| | **78,734** |

**13 වෙනත්**

| | |
|---|---|
| මැනුම් සහා සාමාජිකයන්ගේ දීමනා | 424,567 |
| විගණන කමිටු සාමාජිකයන්ගේ දීමනා | 96,000 |
| විගණන ගාස්තු | 110,000 |
| දැන්වීම් | 96,096 |
| වෙනත් | 90,125 |
| වැඩමුළු වියදම් | 140,030 |
| | **956,818** |

# ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය
# ඉඩම් මැනුම් සභාව

## 2012-12-31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා
## පොදු ගිණුම් ප්‍රතිපත්ති

1. <u>පොදු ගිණුම් ප්‍රතිපත්ති</u>

1.1. සැකසීමේ පදනම
ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිතීන්ට සහ 1971 අංක.38 දරන මුල්‍ය පනතේ විධිවිධානවලට අනුව මූල්‍ය ප්‍රකාශන සකස්කරනු ලැබේ.

1.2. මුල්‍ය ප්‍රකාශන උපචිත පදනමින් සකස් කොට ඇත.

1.3. මුල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මතය යටතේ සකස් කෙරේ.

**2.** <u>වත්කම් වලට අදාළ ඇගයීම්</u>

2.1. ස්ථාවර වත්කම් කපාහල අගයට දක්වා ඇත.

2.2. ක්ෂය වීම
ස්ථාවර වත්කම් ක්ෂයවීම හීනවන ශේෂ ක්‍රමය යටතේ පසුගිය වර්ෂයට අනුකූලව පහත සඳහන් අනුපාතය මත සපයා ඇත.

| වත්කම් වර්ගය | % |
|---|---|
| යන්ත්‍රෝපකරණ | 20 |
| ගෘහ භාණ්ඩ | 10 |
| පරිගණක | 25 |
| කාර්යාලීය උපකරණ | 25 |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No: එල්පී/ඊ/එල්එස්සී/එෆ්ඊ/2012/01

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2013 ජුලි 31 දින.

සභාපති,

ඉඩම් මැනුම් සභාව.

**ඉඩම් මැනුම් සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) සී වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ඉඩම් මැනුම් සභාවේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 2002 අංක 17 දරන ඉඩම් මැනුම් පනතේ 57 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7)(ඊ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සභාවේ සභාපතිවරයා වෙත 2013 අප්‍රේල් 24 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone: 2887028 - 34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail.: oaggov@sltnet.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාර වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ඉඩම් මැනුම් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

ඉඩම් මැනුම් සභාවේ 2006 අප්‍රේල් 02 දිනැති අංක එල්එස්සී/සීඅයිආර්/02/2006 දරන චක්‍රලේඛය ප්‍රකාරව බලයලත් මිනින්දෝරුවරුන් විසින් යම් බිම් කොටසක හිමිකම පැවරීම සඳහා හෝ යම් මායිමක් වෙනස් කිරීම සඳහා සකස් කරනු ලබන පිඹුරක් හෝ සිතියමක සහතික පිටපතක් එම පිඹුරු සහතික කරන ලද දිනයේ සිට දින 30 ක් ඇතුළත දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලවල තැන්පත් කර තැබිය යුතු වුවද ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය අනුව, සමාලෝචිත වර්ෂය තුල සභාවේ මෙහෙයුම් කටයුතු වල රු. 1,429,573 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,050,797 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු. 378,776 ක් හෙවත් සියයට 36 කින් මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයක් ඇතිවී තිබුණි. මිනින්දෝරුවරුන් සඳහා නිකුත් කළ බලපත්‍ර ආදායම වැඩිවීම, මිනින්දෝරුවරු ලියාපදිංචි කිරීමේ ආදායම ඉහළ යාම සහ බැංකු පොලී ආදායම වැඩිවීම මෙම වර්ධනය කෙරෙහි බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

2002 අංක 17 දරන මැනුම් පනතෙහි සඳහන් කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

#### (අ) 37 (අ) වගන්තිය

ඉඩම් මැනීම් කටයුතුවල නියුතු තැනැත්තන් අතර වෘත්තීයමය විනය පවත්වාගෙනයාම සභාවේ ප්‍රධාන අරමුණක්ව තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී විසඳිය යුතුව තිබූ බලය නොලත් පුද්ගලයින් සකසන මැනුම් පිඹුරු හා මිනින්දෝරුවන්ගේ විෂමාචාර ක්‍රියා සම්බන්ධ පැමිණිලි සංඛ්‍යාව 88 ක් විය. එයින් පැමිණිලි 70 ක් සඳහා විසඳුම් ලබා දී තිබූ අතර තවදුරටත් පැමිණිලි 18 ක් සඳහා විසඳුම් ලබාදිය යුතුව තිබුණි.

**(ආ) 37 (ඇ) සහ (ඉ) වගන්ති**

2012 වර්ෂයේ ක්‍රියාකාර සැලැස්මෙහි වෘත්තීය සංවර්ධන වැඩසටහන් 05 ක් පැවැත්වීමට ඉලක්ක කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී වැඩසටහන් 06 ක් පැවැත්වූ බව සඳහන් කර තිබුණද, ඉඩම් මැනුම් සභාව මගින් සත්‍ය වශයෙන් පවත්වා තිබුණේ වැඩසටහන් 02 ක් පමණක් බවත් ඉතිරි වැඩසටහන් 04 මිනින්දෝරු දෙපාර්තමේන්තුව සංවිධානය කරන ලද ඒවා බවත් නිරීක්ෂණය විය.

**(ඇ) 37 (ර) සහ (ල) වගන්ති**

මිනින්දෝරු වෘත්තිය හා සම්බන්ධ සුදුසුකම් ලැබීමේ විභාග පැවැත්වීම, අධ්‍යාපනය, පුහුණුව හා පිළිගැනීම යන කරුණුවලදී සම තත්ත්වයන් ස්ථාපිත කිරීම සඳහා විදේශ රටවල බලධරයන් සමග එකඟතාවක් ඇතිකර ගැනීම වැනි කරුණු අරමුණුකරගෙන තිබූ නමුත් ඒවා ඉටුකර ගැනීම සඳහා කිසිදු වැඩපිළිවෙලක් හඳුන්වා දී නොතිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

ඉ. මැ. ස. /5/501 ලිපිගොනුවට අදාලව රජයේ ඉඩම් ව්‍යාජ ඔප්පු මගින් රාජසන්තකයෙන් බැහැර කිරීමේ චෝදනාවකට ලක්වූ බලයලත් මිනින්දෝරුවරයකුට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙස 2011 ජූලි 03 දිනැති අමාත්‍යාංශ ලේකම්ගේ ලිපියෙන් දන්වා තිබුණද මෙතෙක් එම නිලධාරියා සම්බන්ධයෙන් විමර්ශණයක් පැවැත්වීමට හෝ සභාව අපොහොසත්ව තිබුණි. තවද ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයාගේ 2012 ජූලි 12 දිනැති ලිපිය මගින්ද චූදිත මිනින්දෝරුවරයා රජයේ ඉඩම් සඳහා පෞද්ගලික පිඹුරක් පිළියෙල කරන ලද තවත් අවස්ථාවක් දක්වා තිබූ අතර ඊට එරෙහිව ද පියවර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

සභාවේ මුදල් පොත පරිගණකගත වැඩසටහන් මගින් පිළියෙල කිරීම සඳහා සුදුසු පරිගණක මෘදුකාංගයක් උපයෝගී කරගෙන නොතිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) ඉඩම් මැනුම් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 04 කි. එනම් ලේකම් තනතුරු - 01, පරිගණක දත්ත සටහන් කරු / ලිපිකරු තනතුරු - 02 ක් හා කාර්යාල කාර්ය සහායක තනතුරු - 01 ක් වශයෙන් වුවද ගිණුම් විෂයය හා සභාවේ අරමුණු සහ කාර්යයන් වලට අයත් නීති විෂයය සම්බන්ධයෙන් තනතුරු ඇති කර නොතිබුණි.

(ආ) සභාවේ 2009 වර්ෂයේ සිට පුරප්පාඩුව තිබෙන ලේකම් තනතුර සඳහා වැඩ බැලීමේ පදනම මත නිලධාරියෙකු පත් කිරීමට කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් කර තිබූ ඉල්ලීමට අනුමැතිය දී තිබුණි. 2009 ජනවාරි මස සිට වැඩ බැලීම සඳහා නිලධාරියෙකු පත් කර තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වන තුරු ස්ථිර නිලධාරියෙකු පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 ක්‍රියාකාර සැලැස්ම

ඉඩම් මැනුම් සභාවේ ක්‍රියාකාර සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂයේ මිනින්දෝරුවරුන් ලියාපදිංචි කර ගැනීමේ ඉලක්කය 100 ලෙස දක්වා තිබුණත් මිනින්දෝරුවරුන් 55 ක් ලියාපදිංචි කරගෙන තිබුණි.

### 5.2 අයවැය පාලනය

2012 වර්ෂයේ සභාව වෙනුවෙන් අය වැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණු අතර, වියදම් ඇස්තමේන්තුවක් පමණක් පිළියෙල කර තිබුණි.

### 5.3 පාරිසරික හා සමාජ වගකීම් ඉටු කිරීම

මැනුම් සභාවේ ලියාපදිංචි වී තිබූ මිනින්දෝරුවරයකු නම් දෙකක් භාවිතා කරමින් පිඹුරු පිටපත් සකස් කර තිබූ බව නියැදි පරීක්ෂාවේදී අනාවරණය වූ අතර මේ හේතුවෙන් පිඹුරුපතේ සඳහන් නමට ඉදිරිපත් කරන පැමිණිලි ප්‍රතික්ෂේප වන බවත් එවැනි පිඹුරු පිටපත්වල නීත්‍යානුකූලභාවය පිළිබඳව සභාවේ අවධානය යොමුවී නොතිබූ බවත් නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලන

පද්ධති හා පාලන සම්බන්ධයෙන් විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) ප්‍රචාරණ කටයුතු

එච්.ඒ.එස්. සමරවීර
විගණකාධිපති